(74)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசன மற்றும் நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
MINISTRY OF IRRIGATION AND WATER RESOURCES & DISASTER MANAGEMENT

කාර්යාලය / அலுவலகம் / Office } 0112665170

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை.
Vidya Mawatha, Colombo 07, SRI LANKA
e mail - info@disastermin.gov.lk

ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112665170

මගේ අංකය / எனது இல / My No. } NDRSC/1/1/1-2018-05-II

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2018.10. 05

NDRSC/2018/03 (i)

**දිස්ත්‍රික් ලේකම්**

කුරුණෑගල, අනුරාධපුර, පුත්තලම, මුලතිව්, අම්පාර, වවුනියාව, මාතලේ, කිලිනොච්චිය, මන්නාරම, යාපනය, හම්බන්තොට, රත්නපුර, මඩකලපුව,පොළොන්නරුව

**<u>දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා 2018 නියං සහනාධාර II අදියර ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2018.09.25 දිනැති NDRSC/2018/03 චක්‍රලේඛයෙහි උපදෙස් වලට වැඩිමනත් වශයෙනි.

02. උක්ත චක්‍ර ලේඛයෙහි 11 ඡේදය මඟින් ලබා දී ඇති උපදෙස් අවලංගු කරනු ලබන අතර මෙම වියළි සළාකය ලබා දීමේ දී එහි අඩංගු වන පාරිභෝගික ද්‍රව්‍ය හා ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ද්‍රව්‍යයේ නම | සාමාජිකයින් 3 ට අඩු පවුලක් | | සාමාජිකයින් 3 හෝ 3 ට වැඩි පවුලක් සඳහා | |
|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | දළ වටිනාකම රු. | ප්‍රමාණය | දළ වටිනාකම රු. |
| 1 | සහල් | 20 Kg | 1,360.00 | 30 Kg | 2,040.00 |
| 2 | බිත්තර | 10 | 145.00 | 10 | 145.00 |
| 3 | පරිප්පු | 2 Kg | 220.00 | 3 Kg | 330.00 |
| 4 | දේශීය අර්තාපල් | 2 Kg | 240.00 | 2 Kg | 240.00 |
| 5 | තේ කොළ | 200g | 260.00 | 200g | 260.00 |
| 6 | සීනි | 1 Kg | 100.00 | 2 Kg | 200.00 |
| 7 | තිරිඟු පිටි | 2 Kg | 208.00 | 2 Kg | 208.00 |
| 8 | සෝයා මීට් 70 g | පැකට් 10 | 325.00 | පැකට් 10 | 325.00 |
| 9 | කඩල | 2 Kg | 330.00 | 2 Kg | 330.00 |
| 10 | කිරි පිටි | 400g | 265.00 | 400g | 265.00 |
| 11 | මිරිස් කුඩු | 250 g | 195.00 | 250 g | 195.00 |
| 12 | තුනපහ කුඩු | 250 g | 185.00 | 250 g | 185.00 |
| 13 | කහ කුඩු | 50g | 45.00 | 100g | 90.00 |

~~05~~ 03. පසුගිය සහනාධාර වැඩසටහන්වලදී ලබා දුන් භාණ්ඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව විවිධ පැමිණිලි ඉදිරිපත් වූ බැවින් සියළුම ප්‍රතිලාභීන් වෙත උසස් ගුණාත්මක බවකින් යුතු හා ප්‍රමාණාත්මකව නිවැරදි වන සහනාධාර මල්ලක් ලබාදීමේ අරමුණින් නියං සහනාධාර II අදියරෙහි වැඩසටහන පහත පරිදි ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

06. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයන් සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය මඟින් මිලදී ගෙන එම භාණ්ඩ මෙම අමාත්‍යාංශයේ නම සඳහන් පොලිසැක් කවර තුළ මධ්‍යම ගබඩා සංකීර්ණයන්හි දී ඇසුරුම් කරනු ලැබේ. එහි දී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අප අමාත්‍යාංශය හා සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් යුතු කමිටුවක් විසින් තත්ත්ව පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව සහනාධාර මළු සමුපකාර ප්‍රාදේශික, සී/ස විවිධ සේවා සමුපකාර සමිති හා සතොස වෙත ප්‍රවාහනය කිරීම සිදු කරනු ලබයි.

07. එම සහනාධාර මළු ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමේ දී NDRSC/2018/03 චක්‍රලේඛය මඟින් හිමිකම් ලබන ප්‍රතිලාභීන් වෙතම ප්‍රමාණාත්මකව නිවැරදි හා ගුණාත්මකභාවයෙන් යුතුව ලබා දෙන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරගත යුතු බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

08. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි මසකට අදාළව වියළි සළාක සහනාධාරය ලබාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ලේකම්, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා එවීමෙන් පසුව අමාත්‍යාංශය විසින් අදාළ ප්‍රතිපාදන කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නිදහස් කරනු ලැබේ. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි එක් එක් මසට අදාළව සහනාධාර මළු නිකුත් කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා එම ප්‍රතිලාභීන් වෙත ලබා දුන් සහනාධාරයෙහි වටිනාකම ඔබගේ නිර්දේශ සහිතව මා වෙත කඩිනමින් දැනුම් දීමට කටයුතු කළ යුතුය.

09. තව ද මෙම සහනාධාර ලබා දීම පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු බැවින් ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කරන ලද ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සංයුක්ත තැටියක් මඟින් හෝ විද්‍යුත් තැපෑල මඟින් මාසිකව මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

10. මෙම නියං සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිවරුන් ද සම්බන්ධ කරගන්නා මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

මේ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වන සහයෝගය බෙහෙවින් අගය කොට සලකමි.

**ඩී. ඩී. ආරියරත්න**
ලේකම් (වැ.බ.)
වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත -01. කොමසාරිස්, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව- දැ.ගැ.ස. හා අ.ක.ස
02. සංවර්ධන නිලධාරී (ආපදා සහන සේවා) , ................................................ - දැ.ගැ.ස.